ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය -පෙරහුරු පරීක්ෂණය 2025
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025

| 13 ශ්‍රේණිය | 32 | S | I | ව්‍යාපාර අධ්‍යයනය I<br>Business Studies I | කාලය : පැය දෙකයි<br>Time : Two hours |
|---|---|---|---|---|---|

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති තිත් ඉර මතලියන්න.
- **අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත ලියන්න.**
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමි වේ.

1. පහත වගුවේ දැක්වෙන්නේ ව්‍යාපාර වර්ග කිරීමේ පදනම් කිහිපයක් සහ ව්‍යාපාර වර්ග කිහිපයකි.

| ව්‍යාපාර වර්ග කිරීමේ පදනම | ව්‍යාපාර වර්ග |
|---|---|
| 1. නිෂ්පාදනයේ ස්වභාවය / මට්ටම | A. කෘෂි / කාර්මික / සේවා |
| 2. නිෂ්පාදනයේ අංශ / මූලය | B. සුළු / මධ්‍ය / මහා |
| 3. හිමිකාරත්වය / අයිතිය | C. ප්‍රාථමික / ද්විතියීක / තෘතීයික |
| 4. අරමුණ | D. ලාභලැබීම / ලාභය සඳහා නොවන |
| 5. පරිමාණය | E. පෞද්ගලික / පොදු |

ව්‍යාපාර වර්ග, පදනම් වලට අනුකූලව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න

(1) 1A, 2B, 3C, 4D, 5E
(2) 1A, 2C, 3E, 4D, 5B
(3) 1C, 2A, 3D, 4E, 5B
(4) 1C, 2A, 3E, 4D, 5B
(5) 1B, 2A, 3E, 4C, 5D

(....................)

2. ව්‍යාපාර පැවතීමට අවශ්‍ය මූලික සාධකය කුමක්ද ? යන ප්‍රශ්නයට සිසුන් පස් දෙනෙකු විසින් දෙන ලද පිළිතුරු පහත දැක්වේ. ඒවා අතුරින් ඔබ තෝරන නිවැරදි පිළිතුර කුමක්ද ?

(1) ආයෝජනයට ප්‍රමාණවත් ලාභයක් ලැබීම
(2) හොඳ කළමනාකාරීත්වයක් පැවැතීම
(3) නිෂ්පාදිත සඳහා ඉල්ලුමක් පැවැතීම
(4) මිනිස් අවශ්‍යතා හා වුවමනා පැවැතීම
(5) හුවාමරුව හා ගනුදෙනු සිදුවීම

(....................)

3. පහත වගුවේ X තීරුවේ පරිසර වර්ගීකරණය ද Y තීරුවේ පරිසර බලවේග ද දක්වා ඇත.

| X | Y |
|---|---|
| A අභ්‍යන්තර පරිසරය<br>B ආසන්න පරිසරය<br>C සාර්ව පරිසරය | 1. සේවකයෝ<br>2. ගනුදෙනුකරුවෝ<br>3. සංවිධාන ව්‍යුහය<br>4. තාක්ෂණය<br>5. සමාජ හා සංස්කෘතික<br>6. විභව ව්‍යාපාරිකයෝ |

X හා Y තීරුවල දැක්වෙන පද නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A 1 හා 2 / B 3 හා 4 / C 5 හා 5
(2) A 1 හා 2 / B 3 හා 5 / C 4 හා 6
(3) A 1 හා 4 / B 2 හා 6 / C 3 හා 5
(4) A 1 හා 3 / B 2 හා 5 / C 4 හා 6
(5) A 1 හා 3 / B 2 හා 6 / C 4 හා 5

(....................)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

4. පහත වගුවේ ඇල්මැති පාර්ශ්වයන් කිහිපයක් හා ව්‍යාපාරවල සමාජ වගකීම් කිහිපයක් දක්වා ඇත.

| ඇල්මැති පාර්ශවයන් | සමාජ වගකීම් |
|---|---|
| 1. කොටස්කරුවන් | A රැකියා සහ අවම බාධා |
| 2. සැපයුම්කරුවන් | B සාධාරණ මිල හා ආරක්ෂිත නිෂ්පාදිත |
| 3. පාරිභෝගිකයන් | C අඛණ්ඩ ගනුදෙනු හා නියමිත වේලාවට ගෙවීම |
| 4. ප්‍රාදේශීය ජනතාව | D නිසිකලට බදු |
| 5. රජය | E ආයෝජනයට ප්‍රතිලාභ |

ඇල්මැති පාර්ශවයන් සහ ඔවුන්ට ඉටුවිය යුතු සමාජ වගකීම් නිවැරදිව ගළපන ලද පිළිතුර කුමක්ද ?

(1) 1A, 2B, 3C, 4D, 5E
(2) 1A, 2C, 3B, 4D, 5E
(3) 1E, 2C, 3B, 4A, 5D
(4) 1E, 2B, 3C, 4A, 5D
(5) 1E, 2A, 3C, 4B, 5D

(....................)

5. පහත සඳහන් වනුයේ රජයේ ආර්ථික අරමුණු හා ඒවා ඉටු කරලීමට ව්‍යාපාරික ප්‍රජාවට දායක විය හැකි ආකාරයයි.

A මිල ස්ථායිතාව
B බදු ගෙවීම
C පූර්ණ සේවා නියුක්තිය
D දේශීය සම්පත් භාවිතය
E පරිසර හිතකාමීව කටයුතු කිරීම
F ආර්ථික කාර්යක්ෂමතා

මේවා අතුරින් රජයේ ආර්ථික අරමුණු ලෙස සැලකිය හැක්කේ,

(1) A, B හා C
(2) A, C හා D
(3) A, D හා F
(4) D, E හා F
(5) A, C හා F

(....................)

6. අන්තර්ජාතික වශයෙන් පිළිගෙන ඇති පාරිභෝගික අයිතිවාසිකම් ඇතුළත් කාණ්ඩ කිහිපක් පහත දැක්වේ. මේවා අතුරින් ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයෙකු වූ ජෝන් එෆ්. කෙනඩි විසින් ප්‍රකාශයට පත් කරන ලද පාරිභෝගික අයිතිවාසිකම් හතර පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) ආරක්ෂාව සලසා ගැනීම, තෝරා ගැනීම, වන්දි ලබා ගැනීම, පාරිභෝගික අධ්‍යාපනය
(2) තෝරා ගැනීම, තොරතුරු දැන ගැනීම, වන්දි ලබා ගැනීම, සෞඛ්‍යය සම්පන්න පරිසරයක ජීවත් වීම
(3) ආරක්ෂාව සලසා ගැනීම, තොරතුරු දැන ගැනීම, තෝරා ගැනීම, සවන් යොමු කර ගැනීම
(4) තෝරා ගැනීම, සවන් යොමු කර ගැනීම, වන්දි ලබා ගැනීම, පාරිභෝගික අධ්‍යාපනය
(5) ආරක්ෂාව සලසා ගැනීම, තොරතුරු දැන ගැනීම, තෝරා ගැනීම, වන්දි ලබා ගැනීම

(....................)

7. සීමාසහිත සමාගම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සීමාසහිත පෞද්ගලික සමාගමක අවම කොටස් හිමියන් සංඛ්‍යාව එකකි. උපරිමය සීමාවක් නැත
(2) වෙනත් රටක සංස්ථාගත කර ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු කරන සමාගමක් අක්වෙරළ සමාගමක් ලෙස හැඳින්වේ
(3) සීමාසහිත පෞද්ගලික සමාගමක අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව එකකි. උපරිම සංඛ්‍යාව හතකි
(4) සංස්ථාගත කිරීමේ සහතිකය ලබා ගැනීමෙන් පසු වෙළෙඳ කටයුතු ඇරඹිය හැක්කේ සීමාසහිත පෞද්ගලික සමාගම් වලට පමණි
(5) සීමාසහිත පොදු සමාගමක අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව දෙදෙනෙකි. උපරිමය සීමාවක් නැත

(....................)

8. ව්‍යාපාර සංවිධාන කිහිපයක් සහ ඒවාට අදාළ කරුණු කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| ව්‍යාපාර සංවිධානය | අදාළ කරුණු |
|---|---|
| A රාජ්‍ය සංස්ථා<br>B හවුල් ව්‍යාපාර<br>C සමුපකාර සමිති<br>D සීමාසහිත පොදු සමාගම්<br>E රාජ්‍ය දෙපාර්තමේන්තු | 1. සෑම සාමාජිකයකුටම ඔහු දරන කොටස් ප්‍රමාණය අනුව ඡන්ද බලය හිමි වේ<br>2. රජයේ සෘජු පාලනයට යටත් වේ<br>3. පොදු හෝ විශේෂ පාර්ලිමේන්තු පනත් යටතේ සංස්ථාපිත කෙරේ<br>4. එක් සාමාජිකයකුට හිමි වන්නේ එක් ඡන්දයක් පමණි<br>5. 1918 ව්‍යාපාර නාම ආඥා පනත බලපායි |

ව්‍යාපාරය සංවිධාන හා අදාළ කරුණු නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 2 / B - 5 / C - 1 / D - 3 / E - 4
(2) A - 3 / B - 4 / C - 1 / D - 5 / E - 2
(3) A - 2 / B - 4 / C - 5 / D - 1 / E - 3
(4) A - 3 / B - 5 / C - 4 / D - 1 / E - 2
(5) A - 3 / B - 5 / C - 1 / D - 4 / E - 2

(....................)

9. ව්‍යවසායකත්ව සංවර්ධන ක්‍රියාවලියට බලපාන පුද්ගල සාධක සහ පරිසරාත්මක සාධක කිහිපයක් පහත දැක්වේ.

1. පළපුරුද්ද
2. ආදර්ශමත් / ප්‍රියමනාප චරිත
3. අවස්ථා
4. නායකත්වය
5. තරඟකාරීත්වය
6. අධ්‍යාපනය
7. දක්ම
8. ආයෝජකයින්

මේවා අතුරින් පරිසරාත්මක සාධක ලෙස පිළිගත හැක්කේ,

(1) 2, 4, 7 හා 8
(2) 3, 5, 6 හා 7
(3) 2, 3, 5 හා 8
(4) 3, 6, 7 හා 8
(5) 1, 3, 7 හා 8

(....................)

10. මුදල් යනු කුමක්ද ? යන ප්‍රශ්නයට සිසුන් පස් දෙනෙකු දෙන ලද පිළිතුරු පහත දැක්වේ. ඒවා අතුරින් වඩාත් නිවැරදි පිළිතුර කුමක්ද ?

(1) ගෙවීම් සඳහා භාවිතා කරන රුපියල් හා සත
(2) ගෙවීම සඳහා යොදා ගන්නා ඕනෑම දෙයක්
(3) දේශීය හා විදේශීය ගනුදෙනුවලදී පිළිගන්නා ඕනෑම දෙයක්
(4) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන නෝට්ටු සහ කාසි
(5) හුවමාරු මාධ්‍යයක්, වටිනාකමේ මිම්මක් හා වටිනාකමේ සන්නිධියක් වශයෙන් කටයුතු කරන ඕනෑම දෙයක්

(....................)

11. පහත වගුවේ X තීරුවේ ප්‍රධාන මූල්‍ය ආයතන වර්ග ද Y තීරුවේ මූල්‍ය ආයතන කිහිපයක නම් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A බලපත්‍රලාභී වාණිජ බැංකු<br>B බලපත්‍රලාභී විශේෂිත බැංකු<br>C ලියාපදිංචි මූල්‍ය සමාගම | 1. නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුව<br>2. රජරට සංවර්ධන බැංකුව<br>3. ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව<br>4. ජාතික ඉතිරි කිරීමේ බැංකුව<br>5. එල්.බී. ෆිනෑන්ස් ලිමිටඩ්<br>6. සණස ඩිවලොප්මන්ට් බැංකුව<br>7. මර්කන්ටයිල් ඉන්වෙස්මන්ට් ලිමිටඩ්<br>8. මහජන බැංකුව<br>9. කොමර්ෂල් ක්‍රෙඩිට් ලිමිටඩ් |

Y තීරුවේ මූල්‍ය ආයතන X තීරුවේ වර්ගවලට අනුව ගැලපූ විට ලැබෙන නිවැරදි කාණ්ඩය කුමක්ද ?

(1) A - 1, 2, 5 / B - 3, 4, 7 / C - 6, 8, 9
(2) A - 1, 3, 8 / B - 2, 4, 6 / C - 5, 7, 9
(3) A - 2, 3, 8 / B - 4, 6, 9 / C - 1, 5, 7
(4) A - 4, 6, 8 / B - 2, 5, 7 / C - 1, 3, 9
(5) A - 2, 4, 8 / B - 1, 3, 6 / C - 5, 7, 9

(....................)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers  Model Answers - Study Resources
iexamhub

12. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) පියෙකුට තම පුතාගේ ජීවිතය සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් නොමැත
(2) ආදේශනය, දායකත්වය හා ආසන්නතම හේතුව සහ රක්ෂණ මූලධර්ම පෞද්ගලික හදිසි අනතුරු රක්ෂණය සහ ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් අදාළ නොවේ
(3) එකම දේපළක් සඳහා ද්විත්ව රක්ෂණයක් ලබා ගත්තද, එම දේපළෙහි වටිනාකම ඉක්මවා වන්දි ලබා ගැනීම වළක්වන මූලධර්මය ආදේශනය ලෙස හැඳින්වේ
(4) තම ණයගැතියාගේ ජීවිතය සම්බන්ධයෙන් ණය හිමියාට රක්ෂණ හිමිකමක් ඇත
(5) විශාල වටිනාකමකින් යුක්ත දේපලක් පිළිබඳ අවදානම රක්ෂණ සමාගම් කිහිපයක් එකතුවී භාර ගැනීම හඳුන්වන්නේ ප්‍රතිරක්ෂණය ලෙසය

(....................)

13. පහත වගුවේ දැක්වෙන්නේ ප්‍රවාහනයේ මූලිකාංග සහ මූලිකාංගවලට අදාළ නිදසුන් කිහිපයකි

| **මූලිකාංග** | **නිදසුන්** |
|---|---|
| A මාර්ගය<br>B මාධ්‍යය<br>C බලය<br>D පර්යන්තය | 1. නැව<br>2. මුහුද<br>3. ගුවන් තොටුපළ<br>4. සුළඟ<br>5. ගුවන් යානය<br>6. ගංගා<br>7. වරාය<br>8. ඛනිජ තෙල් |

මූලිකාංග නිදසුන් සමග යා කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) A 1 හා 2 - B 3 හා 4 - C 5 හා 6 - D 7 හා 8
(2) A 2 හා 4 - B 1 හා 5 - C 6 හා 8 - D 3 හා 7
(3) A 2 හා 6 - B 1 හා 5 - C 4 හා 7 - D 3 හා 8
(4) A 2 හා 6 - B 1 හා 5 - C 4 හා 8 - D 3 හා 7
(5) A 2 හා 6 - B 1 හා 3 - C 4 හා 8 - D 5 හා 7

(....................)

14. පහත දැක්වෙන කාණ්ඩ අතුරෙන් ආසියාන් (ASEAN) සංවිධානයට අයත් රටවල් කිහිපයක් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) බෲනායි, භූතානය, මලයාසියාව, සිංගප්පූරුව, ශ්‍රී ලංකාව
(2) බෲනායි, ඉන්දුනීසියාව, මලයාසියාව, සිංගප්පූරුව, තායිලන්තය
(3) බංගලාදේශය, භූතානය, මාලදිවයින, නේපාලය, ශ්‍රී ලංකාව
(4) ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, ඉන්දියාව, නේපාලය, පකිස්ථානය
(5) බෲනායි, භූතානය, ඉන්දියාව, මලයාසියාව, තායිලන්තය

(....................)

15. බලදාස ශ්‍රී ලංකා යුධ හමුදාවේ කපිතාන් තනතුරක් දරයි. තනතුරට අදාළව බලදාසට ලැබෙන බලය හැඳින්වෙන්නේ,
(1) පෞරුෂත්ව බලය ලෙසය (Personality)
(2) අධිකාරී බලය ලෙසය (Authority)
(3) විශේෂඥ බලය ලෙසය (Expert)
(4) අනුහස්බලය ලෙසය (Charismatic)
(5) බලපෑම් කිරීමේ බලය ලෙසය (Referent)

(....................)

16. පහත සඳහන් ප්‍රකාශ අතුරින් සඵලදායකත්වය (Effectiveness) යන්නෙහි අර්ථය නිවැරදිව සඳහන් වන ප්‍රකාශය තෝරන්න.
(1) ආයතනයක අරමුණු හා පරමාර්ථ අපේක්ෂිත අයුරින් ඉටු වීම
(2) අවම සම්පත් ප්‍රමාණයකින් උපරිම නිමැවුමක් ලබා ගැනීම
(3) යෙදවුම් හා නිමැවුම් අතර ඇති අනුපාතික සම්බන්ධතාව
(4) කටයුතු නිවැරදි කිරීම
(5) සම්පත්වල නාස්තිය ශූන්‍ය මට්ටමට ගෙන ඒම (....................)

17. පහත දැක්වෙන්නේ පටු (Narrow) හා පුළුල් (Wide) පාලන අවකාශයන්හි දැකිය හැකි වාසි හා අවාසි කිහිපයකි

A. ඉහළ මට්ටමක පාලනයක් පැවැතීම
B. කළමනාකරු ඒ ඒ පුද්ගලයන් සමග වඩා සමීප බවක් ඇති වීම
C. පිරිවැය අඩු වීම
D. තීරණ ගැනීම වේගවත් වීම
E. සමීප සුපරීක්ෂණයක් ඇති වීම
F. සේවක නිදහස වැඩි වී රැකියා තෘප්තිය ඉහළ යාම

ඉහත සඳහන් දෑ අතුරින් පුළුල් පාලන අවාකශයක වාසි ලෙස සැලකිය හැක්කේ,

(1) A, B හා C ය
(2) B, C හා D ය
(3) C, D හා E ය
(4) C, D හා F ය
(5) D, E හා F ය

(....................)

18. ඉදිකිරීමේ ආයතනයක්, මහල් ගණනාවකින් යුක්ත සුවිශාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් ලබාගෙන ඇත. මෙම ඉදිකිරීම සඳහා වඩා උචිත පිරියත (Layout) වනුයේ,

(1) ක්‍රියාවලි පිරියතයි (Process Layout)
(2) නිෂ්පාදිත / එකලස් කිරීමේ පිරියතයි (Product Layout)
(3) කුටි පිරියතයි (Cellular Layout)
(4) ස්ථාවර ස්ථානීය පිරියතයි (Fixed Position Layout)
(5) කාර්ය බද්ධ පිරියතයි (Functional Layout) (....................)

19. නව තාක්‍ෂණය භාවිතා කිරීමේ ගැටළුවක් නොවන්නේ,

(1) තාක්ෂණය සීඝ්‍රයෙන් වෙනස් වීම.
(2) නම්‍යශීලි නිෂ්පාදන ක්‍රම භාවිතා කළ හැකිවීම.
(3) විශාල ආයෝජනයක් අවශ්‍ය වීම.
(4) පුහුණු ශ්‍රමිකයන් නොමැති වීම.
(5) පරිසර දූෂණය වැඩිවීම. (....................)

20. අලෙවිකරුවෙක් සිය ප්‍රචාරණ, ප්‍රවර්ධන හා වෙනත් අලෙවිකරණ ප්‍රයත්නයන් යොමු කරන නිශ්චිත වෙළෙඳපොළ ඛණ්ඩය හඳුන්වනුයේ,

(1) ගැනුම්කරුවන්ගේ වෙළෙඳපොළ ලෙසය
(2) විකුණුම්කරුවන්ගේ වෙළෙඳපොළ ලෙසය
(3) ඉලක්ක වෙළෙඳපොළ ලෙසය
(4) විභව වෙළෙඳපොළ ලෙසය
(5) නිෂ්පාදිත වෙළෙඳපොළ ලෙසය

(....................)

21. පහත වගුවේ X තීරුවෙන් දැක්වෙන්නේ නිෂ්පාදිතයක ජීවන චක්‍ර අදියරයන්ය. Y තීරුවෙන් දැක්වෙන්නේ ඒ ඒ අදියරයන්ට ආවේණික ගති ලක්‍ෂණයන්ය

| X ජීවන චක්‍ර අදියර | Y ගති ලක්‍ෂණ |
|---|---|
| A හඳුන්වා දීම | 1. ලාභය ඉහළ යයි |
| B වර්ධන | 2. මූලික නිෂ්පාදිතය විවිධත්වයට පත් කරයි |
| C පරිණත | 3. බොහොමයක් ප්‍රචාරණ හා ප්‍රවර්ධන අත්හරී |
| D පරිහානි | 4. පිරිවැය ඉහළ මට්ටමක පවතී |

Y තීරුවේ ගති ලක්‍ෂණ X තීරුවේ ජීවන චක්‍ර අදියරයන්ට අනුව ගැළපූ විට ලැබිය හැකි නිවැරදි පිළිතුර තෝරන්න.

(1) A 1, B 2, C 3, D 4
(2) A 2, B 3, C 4, D 1
(3) A 3, B 4, C 1, D 2
(4) A 4, B 1, C 2, D 3
(5) A 4, B 1, C 3, D 2

(....................)

22. පහත දක්වෙන්නේ ප්‍රචාරණයේ මූලික ගුණාංග සහ ප්‍රචාරණයේ අරමුණුය

A දැනුම් දීම
B පොදු ඉදිරිපත් කිරීම
C පැතිරීම
D පෙළඹවීම
E අපෞද්ගලික වීම
F සිහිපත් කිරීම
G දිරි ගැන්වීම
H අලංකාර ලෙස විස්තර කිරීම

මේවා අතුරින් ප්‍රචාරණයේ අරමුණු ලෙස පිළිගනු ලබන්නේ,

(1) A, D, F හා G ය
(2) A, C, E හා G ය
(3) B, C, E හා G ය
(4) B, E, F හා H ය
(5) B, C, D හා F ය

(....................)

23. පහත සඳහන් කාණ්ඩ අතුරින් මූල්‍යන තීරණ පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) වෙළෙඳ බඩු තොග, ණයගැතියන්, මුදල් සහ ගෙවිය යුතු වියදම් පිළිබඳ තීරණ
(2) කොටස් ප්‍රාග්ධනය, ණය ප්‍රාග්ධනය, ලාභාංශ සහ ව්‍යාපාරය පුළුල් කිරීම පිළිබඳ තීරණ
(3) ස්ථාවර වත්කම්, මුදල්, වෙළෙඳ බඩු තොග සහ ණයගැතියන් පිළිබඳ තීරණ
(4) ණයහිමියන්, කොටස් ප්‍රාග්ධනය, ලාභාංශ සහ ගෙවිය යුතු වියදම් පිළිබඳ තීරණ
(5) ණයහිමියන්, කොටස් ප්‍රාග්ධනය, ලාභාංශ සහ ලැබිය යුතු ආදායම් පිළිබඳ තීරණ

(....................)

24. පහත සඳහන් ප්‍රකාශ අතුරින් මූල්‍ය වෙළෙඳපොළ සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක්ද ?

(1) මුදල් වෙළෙඳපොළ සෑදෙන්නේ මූල්‍ය වෙළෙඳපොළ හා ප්‍රාග්ධන වෙළෙඳපොළ එක්වීමෙනි
(2) කෙටිකාලීන ණය සුරැකුම් සඳහා වූ වෙළෙඳපොළ ප්‍රාග්ධන වෙළෙඳපොළයි
(3) දිගුකාලීන ණය හා සමාගම් බැඳුම්කර සඳහා වූ වෙළෙඳපොළ මුදල් වෙළෙඳපොළයි
(4) භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා සහ සාංගමික බැඳුම්කර මුදල් වෙළෙඳපොළ සුරැකුම්වලට නිදසුන්ය
(5) මූල්‍ය වෙළෙඳපොළ තුළ මූල්‍ය වත්කම් මිලට ගැනීම සහ විකිණීම සිදු කෙරේ

(....................)

25. කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත සමාගම් අතුරින් තෝරාගත් සමාගම් කිහිපයක මිල මට්ටමෙහි ඇති වන උච්චාවචනය පෙන්නුම් කරන දර්ශකය S & P ශ්‍රී ලංකා දර්ශකය ලෙස හඳුන්වයි. මෙම මිල දර්ශකය සඳහා තෝරාගනු ලබන ලැයිස්තුගත සමාගම් ගණන වනුයේ,

(1) 10 (2) 20 (3) 100 (4) 200 (5) 1000

(....................)

26. පහත ලේඛනයේ දැක්වෙන්නේ සේවක පුහුණු වැඩසටහන් වලට හෝ සේවක සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ ලක්ෂණයන්ය.

A. සංකල්පනාත්මක කුසලතා ලබාදේ
B. සාපේක්ෂ දිගුකාලීන වේ
C. තාක්ෂණික කුසලතා ලබාදේ
D. සාපේක්ෂව කෙටිකාලීන වේ
E. කළමනාකරණ සේවකයින් ඉලක්ක කර ගනී
F. අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය
G. ආයතනයේ කාලීන අවශ්‍යතා සඳහා වේ
H. ආයතනයේ අනාගත අවශ්‍යතා සඳහා වේ

මේවා අතුරින් සේවක සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ ලක්ෂණ වන්නේ,

(1) A, B, E, F හා G
(2) A, D, E, F හා H
(3) A, B, E, F හා H
(4) B, C, E, F හා H
(5) B, C, E, F හා G

(....................)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

27. මානව සම්පත් සඳහා වූ ඉල්ලුම පුරෝකථනය කිරීමේදී සැලකිල්ලට ගනු ලබන සාධක පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) රැකියා පිරිවිතරය / රැකියා විස්තරය / විශ්‍රාම යාම් / නිෂ්පාදන ක්‍රමය
(2) ඉලක්ක හා සැලසුම් / නිෂ්පාදිත සඳහා වූ ඉල්ලුම / විශ්‍රාම යාම් / නිෂ්පාදන ක්‍රමය
(3) ආකර්ශනය හා තෝරා ගැනීම / බඳවා ගැනීම / ඉවත්ව යාම් / විශ්‍රාම යාම්
(4) රැකියා පිරිවිතරය / රැකියා විස්තරය / ආකර්ශනය හා තෝරා ගැනීම / බඳවා ගැනීම
(5) නිෂ්පාදන ක්‍රමය / නිෂ්පාදිත සඳහා වූ ඉල්ලුම / බඳවා ගැනීම් / පුහුණුව හා සංවර්ධනය

(....................)

28. ව්‍යාපාරයක එදිනෙදා සිදුවන ඒකාකාරී කටයුතු වාර්තා කිරීම හා සටහන් කිරීම සඳහා උපයෝගී කරගනු ලබන තොරතුරු පද්ධතියකි,

(1) කළමනාකරණ තොරතුරු පද්ධති
(2) විධායක උපකාරක පද්ධති
(3) තීරණ උපකාරක පද්ධති
(4) ගනුදෙනු සැකසුම් පද්ධති
(5) දැනුම් කාර්ය පද්ධති

(....................)

29. තොරතුරු විවිධ පදනම් යටතේ වර්ගීකරණය කෙරේ. ව්‍යාපාර ආයතනයක

* තොග පිරිවැටුම
* දළ ලාභය
* ශුද්ධ ලාභය

වැනි ප්‍රමාණාත්මක තොරතුරු ඇතුළත් කළ හැකි වන්නේ,

(1) මූලාශ්‍ර පදනම් කරගත් වර්ගීකරණයටයි
(2) ස්වභාවය පදනම් කරගත් වර්ගීකරණයටයි
(3) සිදුවීම් පදනම් කරගත් වර්ගීකරණයටයි
(4) නියත හා සම්භාවිතාව පදනම් කරගත් වර්ගීකරණයටයි
(5) සමූහ ගතවීම් හා වෙන් කිරීම් පදනම් කරගත් වර්ගීකරණයටයි (....................)

30. පහත දැක්වෙන්නේ ව්‍යාපාර සැලැස්මක් යනු කුමක්දැයි හැඳින්වීමට සිසුන් පස් දෙනෙකු දැක්වූ අදහස්ය. මේ අතුරින් ව්‍යාපාර සැලැස්ම හැඳින්වීමට වඩාත් යෝග්‍ය ප්‍රකාශය කුමක්ද ?

(1) ව්‍යාපාර ආයතනයක් විසින් වාර්ෂිකව සකස් කරනු ලබන ඉදිරි වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුවකි
(2) ව්‍යාපාරයක ඉදිරි වර්ෂ තුනක් සඳහා වූ සියලු මූල්‍ය ප්‍රකාශ ඇතුළත් ලේඛනයකි
(3) ව්‍යාපාරයක දැක්ම, මෙහෙයවර, අරමුණු හා පරමාර්ථ කවරේද ? ඒවා ඉටුකර ගැනීමට කටයුතු කරන්නේ කෙසේද ? යන්න පැහැදිලිව විස්තර කෙරෙන ලියවිල්ලකි
(4) ව්‍යාපාරය කුමක්ද ? අයිතිකරුවන් හා කළමනාකරුවන් කවුරුන් ද ? යන්න පැහැදිලිව විස්තර කෙරෙන ලියවිල්ලකි
(5) ව්‍යාපාරයක නිෂ්පාදන, අලෙවි හා මූල්‍ය කටයුතු විස්තර කෙරෙන ලියවිල්ලකි.

■ **31 සිට 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

31. අ). භාණ්ඩ, භාවිතය අනුව, පාරිභෝගික භාණ්ඩ හා කාර්මික භාණ්ඩ වශයෙන් වර්ග කෙරේ. තවදුරටත් පාරිභෝගික භාණ්ඩ ........................................................., ......................................................... හා ......................................................... වශයෙන් වර්ග වේ.

ආ). කාර්මික භාණ්ඩ ..........................................., ......................................................... හා ......................................................... වශයෙන්ද වර්ග කර දැක්විය හැකිය.

32. අ). තත්ත්ව පද්ධති පිළිබඳ වූ අන්තර්ජාතික ප්‍රමිතිය ......................................................... ලෙස නම්කර ඇති අතර, පරිසර සංරක්ෂණය පිළිබඳ වූ අන්තර්ජාතික ප්‍රමිතිය ......................................................... ලෙස නම් කර ඇත.

ආ). SLS ලකුණ සහිත නිෂ්පාදිත අලෙවිකිරීම තුලින් ........................................................................ සාර්ථකව මුහුණ දිය හැකිවේ.

33. ව්‍යාපාර පරිසරයට අදාළව පහත සඳහන් සටහනේ දක්වෙන හිස් කොටු හතර (4) නිවැරදි පද භාවිත කරමින් සම්පූර්ණ කරන්න.

අ).




ආ).




34. අ). කොටස් ප්‍රාග්ධනයක් රහිතව ආරම්භ කළ හැකි සමාගම් ........................................................................ ලෙස හැඳින්වෙන අතර, කොටස් හෝ වෙනත් සුරැකුම්පත් මහජනයාට අර්පණය කිරීම තහනම් වන සමාගම් ........................................................................ ලෙස හැඳින්වේ.

ආ). වරලත් ව්‍යාපාර ........................................................ දී වරලත්ලාභියා හා වරලත් හිමියා අතර ඇතිවන ........................................................ වරලත් ගිවිසුම වේ.

35. අ). වෙළෙඳපොළින් ඇදී එන ව්‍යවසායකත්වයට අනුව (Market Pulled Entrepreneurship) පහත දක්වෙන සටහනේ හිස් කොටු නිවැරදි පද යොදා ගනිමින් සම්පූර්ණ කරන්න.




ආ). ................................................ සාදක වශයෙන් අදහස් කරන්නේ ................................................ ගණනය කළ හැකි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හඳුනාගැනීමේ සාදක වේ.

36. අ). පහත දක්වෙන්නේ සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග දක්වීමට යොදා ගන්නා සටහනකි. මෙම සටහනෙහි හිස්ව ඇති කොටු නිවැරදි පද භාවිත කරමින් සම්පූර්ණ කරන්න.




ආ). රක්ෂණයේදී තෙවන පාර්ශවය යන ................................................................ ක්‍රියකරිත්වය තුලින් ඇතිවන ................................................................ පිළිබඳ සම්බන්ධතාවයයි.

37. අ). විශාල පරාසයක් තුළ නැතිනම් රට තුළ පරිගණක රාශියක් හා කාර්ය ස්ථාන රාශියක්, දුරකථන පද්ධතියක් හෝ සැටලයිට් මඟින් සම්බන්ධ කිරීම ................................................................. ලෙස හඳුන්වන අතර,එක ගොඩනැගිල්ලක හෝ කුඩා භූගෝලීය ප්‍රදේශයක පෞද්ගලික පරිගණක සහ කාර්ය ස්ථාන රැහැන් සහිත හෝ රහිත තාක්‍ෂණය මඟින් සම්බන්ධ කිරීම ................................................................. ලෙස හැඳින්වේ.

38. නිෂ්පාදන ක්‍රම 1, 2, 3 යන කොටුවල ද, එක් එක් නිෂ්පාදන ක්‍රමවලට නිදසුන් x, y, z යන කොටුවල ද පිළිවෙළින් දැක්වෙන ආකාරයට පහත සටහන සම්පූර්ණ කරන්න.

අ). 1 .......................................... 2 .......................................... 3 ..........................................

ආ). x .......................................... y .......................................... z ..........................................

39. තම සේවක ඉල්ලීම් දිනා ගැනීම සඳහා වෘත්තීය සමිතියක සාමාජිකයන් දිනක් හෝ වරුවක් රාජකාරියෙන් බැහැරව සිටීම ........................................................... වන අතර, තම ඉල්ලීම් විරෝධතා පෑම මගින් දිනා ගැනීමට නොහැකි වූ විට ඉල්ලීම් ලැබෙන තුරු වැඩ කිරීම සම්පූර්ණයෙන් නතර කිරීම ................................................................ වේ.

ආ.) ලැයිස්තුගත සමාගමක් විසින් නිකුත් කර ඇති කොටස් වෙළඳපොළ අගය සමාගමේ ............................................................ ලෙස හැඳින්වෙන අතර, අතීතයේ කඩ කළ පුවරුව ලෙසින් හැඳින්වූ පුවරුව වර්තමානයේ ................................................................ ලෙසින් හැඳින්වේ.

40. අ). අග්‍ර මට්ටමේ කළමනාකරුවන්ට ................................................................ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ලබාදීමට සැකසුන තොරතුරු පද්ධති ................................................................ වේ.

ආ). පුද්ගලයෙකුගේ හෝ සංවිධානයක අවශ්‍යතාවයක් හෝ වුවමනාවක් ඉටු කළ හැකි නිෂ්පාදිතයක් පිළිබඳ ව්‍යවසායකයෙකු තුළ ඇතිවන සිතුවිල්ල................................................................ වේ. මෙය සර්ව හා සූක්ෂම විශ්ලේෂණයකට භාජනය කිරීම මගින් ................................................................ තීරණය කළ යුතුය.

- **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්න වලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

41. සමහර ව්‍යාපාර ආයතන සිය ව්‍යාපාරයට අදාළ ආචාර ධර්ම ලිඛිතව ප්‍රකාශයට පත් කරයි. එම ආචාර ධර්ම පද්ධතියෙන් ආවරණය වන පාර්ශව දෙකක් නම් කරන්න.

(1) ..........................................................................................................................................

(2) ..........................................................................................................................................

42. රජයේ අයවැය ලේඛනයක සඳහන් වන රාජ්‍ය වියදම් ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇත. එම කොටස් දෙක කවරේද ?

(1) ........................................................................................ (2) ........................................................................................

43. හවුල් ව්‍යාපාරයක් ඇති වීමට අනිවාර්යයෙන් තිබිය යුතු ලක්‍ෂණ හතර සඳහන් කරන්න.

(1) ..........................................................................................................................................

(2) ..........................................................................................................................................

(3) ..........................................................................................................................................

(4) ..........................................................................................................................................

44. කුඩා ව්‍යාපාර හඳුනා ගැනීමට යොදා ගන්නා නිර්ණායක අනුව ඒවායේ දැකිය හැකි ගති ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(3) ..........................................................................................................................

(4) ..........................................................................................................................

45. විද්‍යුත් බැංකුකරණය (e-banking) සිදුවන ආකාර හතරක් නම් කරන්න.

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(3) ..........................................................................................................................

(3) ..........................................................................................................................

46. විද්‍යුත් වාණිජ්‍යය (e-commerce) පුළුල් කොටස් හතරකට බෙදිය හැකිය. එම කොටස් හතර නම් කරන්න.

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(3) ..........................................................................................................................

(4) ..........................................................................................................................

47. තාක්ෂණික, මානව හා සංකල්පීය කුසලතා පමණක් නූතන කළමනාකරුවන්ට ප්‍රමාණවත් නොවේ. ඊට අමතරව කළමනාකරුවන්ට අවශ්‍ය කෙරෙන කුසලතා හතරක් නම් කරන්න.

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(3) ..........................................................................................................................

(4) ..........................................................................................................................

48. (අ) කිසියම් තනතුරකට බඳවාගත් නවක සේවකයකු එම තනතුරෙහි ස්ථිර කිරීමට පෙරාතුව සේවය කළ යුතු කාල පරිච්ඡේදය හඳුන්වන්නේ කවර නමකින්ද ?

..........................................................................................................................

(ආ) කිසියම් ශිල්පීය වෘත්තියක් සඳහා බඳවා ගත් නව සේවකයකු ගත කළ යුතු පුහුණු කාල පරිච්ඡේදය හඳුන්වන්නේ කවර නමකින්ද ?

..........................................................................................................................

49. තොරතුරු පද්ධතියක කාර්යයන් හතරක් ලියා දක්වන්න.

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(3) ..........................................................................................................................

(4) ..........................................................................................................................

50. ව්‍යාපාර සැලැස්මක අවශ්‍යයෙන්ම ඇතුළත් විය යුතු මූල්‍ය ප්‍රකාශ හතරක් නිවැරදිව ලියා දක්වන්න.

(1) ........................................................ (3)........................................................

(2) ........................................................ (4)........................................................

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය -පෙරහුරු පරීක්ෂණය 2025
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025

| 13 ශ්‍රේණිය | 32 | S | II | ව්‍යාපාර අධ්‍යයනය II<br>Business Studies II | කාලය : පැය දෙකයි<br>Time : Two hours |
|---|---|---|---|---|---|

**උපදෙස්:**

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

I කොටස

1. ගයත්‍රි තම නිවසේ දී බිරියානි සහ චොක්ලට් බ්‍රවුනීස් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. facebook හා වට්ස්ඇප් හරහා ඇනවුම් ලබාගෙන තම නගරයට ආසන්න නගර වෙත ගොස් එම ඇනවුම් භාර දෙයි. ඇය තම වාහනයෙන් ගොස් නිෂ්පාදන බෙදා හැරීමේ කටයුතු සිදුකරයි. ස්වාමිපුරුෂයාගේ හා දරුවන්ගේ උදව් මෙම ව්‍යාපාරය ඉදිරියට ගෙනයාමට ඉවහල් වී ඇත.

i. (අ) ගයත්‍රි විසින් තම පාරිභෝගිකයන්ට සපයන නිෂ්පාදිත දෙක උදාහරණ සහිතව නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ගයත්‍රිගේ ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව හතරක් ලියන්න. (ලකුණු 02 යි)

ii. (අ) ඉහත ව්‍යාපාරය පහත සඳහන් පදනම් යටතේ අයත් වන්නේ කවර ව්‍යාපාර වර්ගයට දැයි සඳහන් කරන්න .

1. නිෂ්පාදනයේ ස්වභාවය අනුව
2. හිමිකාරීත්වය අනුව (ලකුණු 02 යි)

(ආ) ඉහත ව්‍යාපාරයට අදාල ආසන්න පරිසර බලවේග හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

iii. (අ) ගයත්‍රි සතු ශක්තීන් දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදන ගුණාත්මක බව තහවුරුකර ගැනීම ඇගේ ව්‍යාපාරයට වැදගත් වන කරුණු හතරක් දක්වන්න. (ලකුණු 02 යි)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

iv. (අ) ගයාත්‍රිට තම ව්‍යාපාරයේ අපද්‍රව්‍ය කළමනාකරණය කළ හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම සිද්ධියේ ඇතුළත් ව්‍යාපාර ගති ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

v. ක්ලීන් ශ්‍රී ලංකා (clean Sri Lanka) ව්‍යාපෘතියේ අරමුණු අනුව කටයුතු කිරීමේදී ඉහත ආයතනය අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හතරක් දක්වන්න. (ලකුණු 04 යි)

2. "Our dream crafts" නමින් මලිති හා අශ්මා ගෘහ අලංකරණ උපකරණ නිපදවීමේ ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යයි. මලිතිට අයත් ගොඩනැගිල්ලක මෙම ව්‍යාපාරය පවත්වාගෙන යන අතර සේවකයින් කිහිප දෙනෙක්ද ඔවුන් යටතේ සේවය කරයි. ඔවුන්ගේ පාසල් මිතුරියක් වන වාසනා මෙම ව්‍යාපාරය සඳහා එකතුවීමට කැමැත්තක් දක්වන බව අශ්මා ප්‍රකාශ කළත්, මලිති ඊට කැමැත්තක් දක්වා නොමැත. කෙසේ වෙතත් our dream crafts ව්‍යාපාරය පෙර පරිදිම ඉදිරියට කරගෙන යාමට දෙදෙනා තීරණය කරන ලදී.

i. (අ) ඉහත ව්‍යාපාර වර්ගයට පමණක් සුවිශේෂී වූ ලක්ෂණ හතරක් සඳහන කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ව්‍යාපාරය සම්බන්ධයෙන් මලිති හා අශ්මාට ඇති අයිතිවාසිකම් හතරක් දක්වන්න. (ලකුණු 02යි)

ii. (අ) අශ්මා එකග වුවද වාසනා ව්‍යාපාරයට බඳවා ගැනීමට මලිති එකඟ නොවීම මත එය ඉටු නොවීමට හේතු වූ කරුණු සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) (අ) හී ඔබේ පිළිතුරට හේතු වූ නීතිමය තත්ත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

iii. (අ) මෙම ව්‍යාපාරය මලිති හෝ අශ්මා යන දෙදෙනාගෙන් එක් අයෙකු පමණක් පවත්වාගෙන යන්නේ නම් ඇය අත්කර ගන්නා වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) මෙම ආයතනයේ හිමිකරුවන් මෙන්ම සේවකයන්ද පාරිභෝගිකයන් කෙරෙහි පිළිපැදිය යුතු ආචාර ධර්ම හතරක් ලියන්න. (ලකුණු 02යි)

iii. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම නව ව්‍යවසායක සමුළුවක් සහ නවෝත්පාදන උළෙලක් වන Disrupt Asia 2025 පසුගියදා කොළඹ සිනමන් ලයිෆ් හෝටලයේදී පැවැත්විණි. මෙම වැඩසටහන හරහා දේශීය ව්‍යවසායකයන්ට සහ නව නිපැයුම්කරුවන්ට ගෝලීය අවධානයක් හා අවස්ථාවක් හිමිවේ.

(අ) මෙවැනි සමුළු හරහා මෙන්ම ව්‍යවසායකයින්ට තම කුසලතා වර්ධනය කර ගත හැකි ආකාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

(ආ) රටක ව්‍යාවසායකයින්ට නැඟී සිටීමට අනුග්‍රහය සැපයීම අනුබලදීම රජයක මූලික අරමුණ විය යුත්තේ ඇයි දැයි කරුණු හතරක් දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

v. (අ) ව්‍යාවසායකයෙක් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක වීමට රජයට දායක විය හැකි ආකාර දෙකක් දක්වා ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

3. දසුන් විද්‍යුත් වෙළඳාම් මගින් විවිධ භාණ්ඩ මිලදී ගන්නා තරුණයෙකි ඔහු නිතරම තම දුරකථනය භාවිතා කරමින් ඩිජිටල් ගෙවීම් සිදුකරයි එදිනක් ඔහුට ඔබේ ගිණුම තාවකාලිකව අක්‍රිය වී ඇත ැවත සක්‍රිය කිරීමට පහත සැබඳිය මත ක්ලික් කරන්න යන කෙටි පණිවිඩය ලැබුණි දසුන් එම සබැඳිය මත ක්ලික් කර තම පරිශීලක නාමය මුරපදය හා කල්පත් විස්තර ඇතුළත් කරන ලදින් විනාඩි කිහිපයකට පසුව ඔහුගේ ගිණුමේ මුදල් විශාල ප්‍රමාණයක් අඩුවී ඇති බව දක්නට ලැබුණි.

i. (අ) ඉහත සිද්ධියේ සඳහන් ඩිජිටල් ගෙවීමක් යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) ඩිජිටල් ගෙවීම් සඳහා නිදසුන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

ii. (අ) ඩිජිටල් ගෙවීමක විශේෂ ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) විද්‍යුත් කාඩ්පත් භාවිතා කරන්නන් පිළිපැදිය යුතු ආරක්ෂිත පියවර හතරක් දක්වන්න. (ලකුණු 02යි)

ii. ගයාන් තම ගනුදෙනුකරුවෙකුට රු. 500 000.00 වටිනා චෙක්පතක් නිකුත් කරන ලදි. ඔහුගේ ජංගම ගිණුමේ චෙක්පතේ වටිනාකම ඉක්මවා මුදල් තිබුණි. ගයාන් චෙක් පත නිවැරදිව පුරවා අත්සනද නිවැරදිව යොදා තිබුණි. අදාළ ගනුදෙනුකරු චෙක්පත බැංකුවට ඉදිරිපත් කළ විට එය අගරු විය.

(අ) ඉහත සිද්ධියට අදාළ ගයාන්ගේ චෙක්පත අකරු වීමට හේතු දෙකක් දක්වන්න. (ලකුණු 02යි)

(ආ) චෙක්පතක් අගරු වීම ගනුදෙනුකරුට හා ව්‍යාපාරිකයාට ඇති කරන බලපෑම් දෙක බැගින් ලියන්න. (ලකුණු 02යි)

iv. (අ) රක්ෂණ ඔප්පුව යන්න හඳුන්වන්න. (ලකුණු 02යි)

(ආ) රක්ෂණ ගිවිසුමකට සම්බන්ධ තෙවන පක්ෂය යනු කවුරුන් ද? (ලකුණු 02යි)

v. (අ) බහාලුම් නෞකාවක් තම නියමිත ගමන් මාර්ගයෙන් බැහැරව වෙනත් ගමන් කිරීම කවර නමකින් හඳුන්වන්නේ ද? (ලකුණු 02යි)

(ආ) ජීවිත රක්ෂණ හිමියා මියගිය විට යැපෙන්නන් ලෙස බිරිඳට හා දරුවන්ට එම ජීවිත රක්ෂණය හිමිවීම තුළින් ලැබෙන ප්‍රතිලාභ හතරක් දක්වන්න. (ලකුණු 02යි)

4. i. නිමි ඇඳුම් ව්‍යාපාර දෙකක් තම ව්‍යාපාරයේ අලෙවි අංශයට සංනිවේදනය යොදා ගැනීම සම්බන්ධ තොරතුරු පහත වගුවේ ඇතුළත් වේ.

| ආයතනය | සංනිවේදන ක්‍රියාමාර්ග | අලෙවි අංශයේ කාර්යක්ෂමතාව |
|---|---|---|
| A ආයතනය | දිනපතා පණිවිඩ හා විද්‍යුත් තැපැල භාවිත කිරීම<br>මාසිකව රැස්වීම් පැවැත්වීම | ඉහලයි |
| B ආයතනය | තොරතුරු නිසිලෙස බෙදා නොදීම<br>මූලික උපදෙස් නොසලකා තීරණ ගැනීම | අඩු වී ඇත |

(අ) ඉහත වගුවට අනුව A ව්‍යාපාරය තම අලෙවි අංශය වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග එම අංශයේ කාර්යක්ෂමතාවයට බලපාන්නේ කෙසේදැයි කරුණු දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) B ආයතනයට අලෙවි අංශයේ කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

ii. ශ්‍රී ලංකාවේ දුම්රිය ප්‍රවාහනය අකාර්යක්ෂම මට්ටමක පවතී. මෙය මගීන්ට මහත් අපහසුතාවයක් ඇති කරන අතරම රටේ ආර්ථික ක්‍රියාකාරකම් වලටද බාධාවක් බවට පත්ව ඇත.

(අ) වර්තමාන දුම්රිය ප්‍රවාහනයේ ඔබ හඳුනාගත් ගැටලු හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) දුම්රිය ප්‍රවාහන ක්ෂේත්‍රයේ අකාර්යක්ෂමතාවය ජාතික ආර්ථිකයට ඇති කරන සෘණාත්මක බලපෑම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(අ) ගබඩාවත් තෝරාගැනීමෙන් පසුව එහි භාණ්ඩ හැසිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ආ) ගබඩා පිරිවැය ගණනය කිරීමේදී ඇතුළත් කරන වියදම් හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

iv. බේකරි නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කළ රකිත තම නිෂ්පාදනය බෙදා හැරීම සඳහා අතරමැදියන් යොදා නොගැනීමට තීරණය කරන ලදී.

(අ) අතරමැදියන් යොදා නොගැනීමෙන් රකිත භුක්ති විඳින වාසි හතරක් ලියන්න. (ලකුණු 02 යි)

(ආ) කැපකරු නියෝජිතයා යන්න හඳුන්වන්න. (ලකුණු 02 යි)

v. (අ) ණයවර ලිපිය යනු කුමක්ද? (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරිකයෙකුට ණයවර ලිපියක් වැදගත්වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

## II කොටස

5. "Tiny Bites Bakery" ආයතනය ප්‍රදේශයේ ප්‍රසිද්ධ බේකිරි නිෂ්පාදන ආයතනයකි. එහි හිමිකාරිය වන දෙව්ලි තම ව්‍යාපාරයේ අරමුණු කරා යැමේදී ආයතනයට සම්බන්ධ විවිධ පාර්ශව සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින්, නව නිෂ්පාදනය කෙරෙහි නිතරම අත්හදා බැලීම් කරයි. මනා ලෙස කළමනාකරණය කරමින්, නිෂ්පාදන ක්‍රියාවලිය නිතරම නිරීක්ෂණ කරමින් සිදුවිය හැකි වැරදි ඒ මොහොතේම නිවැරදි කිරීමට කටයුතු කරයි. කාණ්ඩ නිෂ්පාදන ක්‍රමය යොදා ගනිමින් නිෂ්පාදනය කරන ඇය නිතරම වෙනස් වන තාක්ෂණික උපකරණ පිළිබඳව අවධානය යොමු කරයි.

i. (අ) දෙව්ලි කළමනාකරුවකු ලෙස ඉටුකරනු ලබන උපභූමිකා දෙකක් උදාහරණ සහිතව සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) දෙව්ලිගේ කළමනාකරන හැකියාව ඇගේ ව්‍යාපාරයට වැදගත් වන්නේ කෙසේදැයි කරුණු හතරකින් දක්වන්න. (ලකුණු 02 යි)

ii. (අ) සැලසුම්කරනයේ දී දෙව්ලිට පැන නැගිය හැකි ගැටලු හා සීමා හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) සාර්ථක නායකයකු තුළ තිබිය යුතු නායකත්ව ගුණාංග හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

iii. (අ) දෙව්ලි තම ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ භාවිත කරන පාලන ශිල්පීය ක්‍රමය සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) (අ) හි ඔබ සඳහන් කළ පාලන ශිල්පීය ක්‍රමය සඳහා නිදසුන් දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

iv. (අ) කාණ්ඩ නිෂ්පාදන ක්‍රමය යනු කුමක්ද? (ලකුණු 02 යි)

(ආ) කාණ්ඩ නිෂ්පාදන ක්‍රමයේ වාසි හා අවාසි දෙක බැගින් ලියන්න.

(ලකුණු 02 යි)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

v. (අ) බිස්කට්/ cookies නිෂ්පාදන ආයතනයකට නව තාක්ෂණය

යොදාගත හැකි ආකාර දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) නව තාක්ෂණය යොදා ගැනීම මගින් දෙව්ලිගේ ව්‍යාපාරයට ඇතිවන ප්‍රතිලාභ හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

6. "ග්‍රීන් ෆ්‍රෙෂ් ජූස්" ආයතනය තම පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා සෞඛ්‍ය සුරක්ෂිත පාන නිෂ්පාදනයේ නිරත වේ. නිෂ්පාදන සඳහා ස්වභාවික හා විෂ රහිත පලතුරු භාවිතා කිරීම, නැවත භාවිත කළ හැකි බෝතල් වල බීම ඇසුරුම් කිරීම සිදු කරයි. මෙම ආයතනය මූලික තේමාව "සෞඛ්‍ය සුරක්ෂිත පාරිභෝගිකයයි-පිරිසිදු පරිසරයයි" යන්නයි. එමෙන්ම ප්‍රදේශයේ පාසල්වල සෞඛ්‍ය සම්බන්ධ වැඩසටහන්වලට තම දායකත්වය ලබා දෙයි.

i. (අ) ඉහත ආයතනය තම නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා යොදා

ගෙන ඇති අලෙවිකරන සංකල්පය නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සම්බන්ධතා අලෙවිකරණය යන්න හඳුන්වන්න. (ලකුණු 02 යි)

ii. (අ) "ග්‍රීන් ෆ්‍රෙෂ් ජූස්" ආයතනයට ඇසුරුම්කරණය මගින් ලබාගත

හැකි ප්‍රතිලාභ හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත ආයතනයේ නිෂ්පාදිතයේ ලේබලයේ ඇතුළත් විය යුතු

කරුණු හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

iii. (අ) මිල තීරණය කිරීමේ පරමාර්ථ හතරක් සඳහන් කරන්න.

(ලකුණු 02 යි)

(ආ) ඉහත ව්‍යාපාරයට යොදාගත හැකි ප්‍රවාරණ ක්‍රම හතරක් දක්වන්න.

(ලකුණු 02 යි)

iv. (අ) ව්‍යාපාරයකට යොදාගත හැකි බාහිර මූල්‍ය සම්පාදන මාර්ග

දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයක ආයෝජන තීරණ එහි සාර්ථකත්වය සඳහා බලපාන

ආකාරය කරුණු දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

v. (අ) ද්‍රවශීලතා අනුපාත යනු කුමක්දැයි හඳුන්වා එය ගණනය කිරීමේ

අරමුණු දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) රජයේ සුරගම්පත්වල ආයෝජනයෙන් ආයෝජකයෙකු ලබන ප්‍රතිලාභ මොනවා ද? (ලකුණු 02 යි)

7. i. (අ) සීමිත පොදු සමාගමක් කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි

විය හැකි ආකාර දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) කොළඹ කොටස් හුවමාරුව මෙරට ආර්ථිකයට වැදගත් වන්නේ මන්දැයි කරුණු හතරක් දක්වන්න. (ලකුණු 02 යි)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

ii. රේන්බෝ ඇපරල් (පුද්ගලික) සමාගම ඇඟලුම් ක්ෂේත්‍රයේ නියැලී සිටින ආයතනයකි. 2025 සැප්තැම්බර් මාසයේ දී මෙම සමාගම විසින් නව අපනයන ගිවිසුමක් අත්සන් කර අතර 2026 ජනවාරි සිට නිෂ්පාදන ධාරිතාව 30% වැඩි කිරීමට තීරණය කරන ලදී. ගණකාධිකාරීවරිය ලෙස කටයුතු කරන මාලනි මහත්මිය විදෙස්ගත වීමට අවශ්‍ය ලියවිලි මානව සම්පත් අංශයට භාර දී ඇත.

(අ) 2026 සඳහා මානව සම්පත් අවශ්‍යතා පුරෝකථනය කිරීමේ දී රේන්බෝ ඇපරල් ආයතනය අවධානය යොමු කළ යුතු සාධක දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත ආයතනය තම සේවක අවශ්‍යතා සපුරා ගැනීමට බාහිර ආකර්ෂණ මාර්ග තෝරාගන්නේ නම් ආයතනය ලබන වාසි හා අවාසි දෙක බැගින් ලියන්න. (ලකුණු 02 යි)

iii. (අ) මෙම ආයතනයට 2026 නව සේවකයන් බඳවා ගැනීමේ දී යොදා ගත හැකි පදනම් දෙක දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) පත්වීම් ලිපිය ආයතනයකට මෙන්ම සේවකයන්ටද වැදගත් ලියවිල්ලකි. සේවකයෙකුට පත්වීම් ලිපිය වැදගත් වන හේතු දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

ලංකා ග්‍රීන් හාවස්ට් සමාගම දිවයිනේ ප්‍රසිද්ධ පොහොර නිෂ්පාදන සමාගමකි. ජාත්‍යන්තර රසායනික මිල ඉහළ යාම හේතුවෙන් සමාගමේ ලාභය අඩු විය. මේ කළමනාකරණය කිරීම සඳහා සේවක ප්‍රවර්ධන හා පුහුණු වැඩසටහන් සීමා කිරීම සේවක වාර්ෂික ප්‍රසාද දීමනා තාවකාලිකව නතර කිරීම වැනි පියවර වලට එළඹෙන ලදී. මේ සම්බන්ධව සේවක අතෘප්තිය වැඩි වීමත් කළමනාකරණය ඔවුන්ගේ ගැටලු සාකච්ඡාවට අවස්ථාවක් නොදීමත් නිසා සේවකයින් වෘත්තිය සමිතියක් ලෙස අකුරට වැඩ කිරීමේ ක්‍රියාමාර්ගයට එළැඹෙන ලදී.

iv. (අ) ඉහත ආයතනය සේවක දුක් ගැනවිලි විසඳීම සඳහා ගත යුතුව තිබූ පියවර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සේවක දුක් ගැනවිලි නොවිසිදීම නිසා ලංකා ග්‍රීන් හාවස්ට් සමාගමට අත්විඳීමට සිදුවන අවාසි හතරක් දක්වන්න.

(ලකුණු 02 යි)

v. (අ) ඉහත ආයතනයේ සේවකයන්ට තවදුරටත් ගත හැකි වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හතරක් ලියන්න. (ලකුණු 02 යි)

(ආ) වැඩ වර්ජන රටක ආර්ථිකයකට කරන අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

8. i. (අ) දත්ත ඉදිරිපත් කළ හැකි ක්‍රම හතරක් නිදසුන් සහිතව සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) තොරතුරු පද්ධතියක් යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

ii. (අ) ගනුදෙනු සැකසුම් පද්ධතිය යන්න හඳුන්වා ඒ ඒ අංශ මගින්

යොදාගනු ලබන ගනුදෙනු සැකසුම් පද්ධති දෙක බැගින් ලියන්න.

(ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාර බුද්ධි තොරතුරු පද්ධතියක් යන්න හඳුන්වන්න.

(ලකුණු 02 යි)

iii. (අ) ව්‍යාපාර ආයතනයකට තම කාර්යයන් පහසු කර ගැනීමට

තොරතුරු තාක්ෂණය වැදගත් වේ. මෙම ප්‍රකාශය සනාථ කිරීමට හේතු හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) තොරතුරු තාක්ෂණය තුළින් ව්‍යාපාර ආයතනයක් අත්කර ගන්නා ප්‍රතිලාභ මොනවාද? (ලකුණු 02 යි)

iv. (අ) අලෙවි කරන සැලැස්මක් ව්‍යාපාරිකයකුට වැදගත් වීමට හේතු දෙකක්

ලියන්න. (ලකුණු 02යි)

(ආ) තරගකාරී විශ්ලේෂණයේ දී ඉදිරිපත් කළ යුතු තොරතුරු දෙකක් දක්වන්න.

(ලකුණු 02යි)

v. (අ) විධායක සාරාංශයේ මූලික පරමාර්ථය කුමක්ද? (ලකුණු 02යි)

(ආ) විධායක සාරාංශය වැදගත් වීමට හේතු දෙකක් ලියන්න. (ලකුණු 02යි)


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ව්‍යාපාර අධ්‍යයනය - 13 ශ්‍රේණිය
පෙරහුරු පරීක්ෂණය - 2025

| | | | |
|---|---|---|---|
| 01. | 4 | 16. | 1 |
| 02. | 4 | 17. | 4 |
| 03. | 5 | 18. | 4 |
| 04. | 3 | 19. | 5 |
| 05. | 5 | 20. | 3 |
| 06. | 3 | 21. | 4 |
| 07. | 5 | 22. | 1 |
| 08. | 4 | 23. | 4 |
| 09. | 3 | 24. | 5 |
| 10. | 5 | 25. | 2 |
| 11. | 2 | 26. | 3 |
| 12. | 1 | 27. | 2 |
| 13. | 4 | 28. | 4 |
| 14. | 2 | 29. | 2 |
| 15. | 2 | 30. | 3 |

31. අ) පහසු භාණ්ඩ, සාප්පු භාණ්ඩ, විශේෂිත භාණ්ඩ. හා නොසෙවූ භාණ්ඩ
ආ) ද්‍රව්‍ය හා කොටස්, ප්‍රාග්ධන අයිතම, සැපයුම් හා ව්‍යාපාර සේවා.

32. අ) ISO 9001- 2000, ISO 14001
ආ) තරඟකාරීත්වයට

33. අ) ශක්තීන්, ගැලපෙන පිළිතුරකට ලකුණු දෙන්න.
ආ) අවස්ථා, සම්පත් යන්න තර්ජන ලෙස නිවැරදි වී ඊට ගැලපෙන පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
iexamhub

34. අ) ඇපයෙන් සීමිත සමාගම්, සීමාසහිත පෞද්ගලික සමාගම්.
ආ) ආරම්භ කිරීමේ දී, ඵලතාව

35. අ) අවස්ථාව, සාර්ථක ව්‍යාපාරය
ආ) ප්‍රමාණාත්මක, සංඛ්‍යාත්මකව

36. අ) ප්‍රතිපෝෂණය, ප්‍රත්‍යාචාරය
ආ) හිමිකරුවෝ, බාහිර පාර්ශව

37 අ) පුළුල් ක්ෂේත්‍ර ජාල (WAN)
ප්‍රාදේශීය ක්ෂේත්‍ර ජාල (LAN)

38 අ) 1 කාර්ය / ඇනවුමට 2 කාණ්ඩ / සමූහ 3. ප්‍රවාහ / මහාපරිමාණ
ආ) x ගැලපෙන නිදසුනක් Y. ගැලපෙන නිදසුනක්
Z. ගැලපෙන නිදසුනක්.

39. අ) සංකේත වර්ණනය, වැඩ වර්ණනය
ආ) වෙළඳපොළ ප්‍රාග්ධනය, මොඩ් ලිස්ට්

40. අ) උපක්‍රමික, උපක්‍රමික මට්ටමේ තොරතුරු පද්ධතිය.
ආ) ව්‍යාපාර අදහස, ව්‍යාපාර අවස්ථාවක්.

41. අයිතිකරුවන්, සේවකයන්, ගනුදෙනුකරුවන්, ප්‍රජාව / සමාජය

42. 1. වර්තන වියදම් / පුනරාවර්තන වියදම්
2. ප්‍රාග්ධන වියදම්.

43. පුද්ගලයන් සිටීම, ලාභ ලැබීමේ අරමුණක් තිබීම, ව්‍යාපාර කටයුත්තක් පැවතීම., අන්‍යෝන්‍ය සම්බන්ධතා-යක් තිබීම.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

44. වෙළඳපොළ කොටස වැඩි වීම, අඛණ්ඩව සංවර්ධනයක් පැවතීම, තාක්ෂණය භාවිතය අඩු වීම, සාපේක්ෂව වැඩි ප්‍රාග්ධනයක් ආයෝජන කර තිබීම, ශ්‍රම සූක්ෂම වීම.

45. ATM, EFTPOS, Online Banking, Home Banking
Mobile Banking, Tele Banking

46. ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට B to B
ව්‍යාපාරයෙන් ගනුදෙනුකරුට B to C
ගනුදෙනුකරුගෙන් ගනුදෙනුකරුට C to C
ව්‍යාපාරයෙන් රජයට B to G

47. තීරණ ගැනීමේ කුසලතා, සන්නිවේදන කුසලතා,
කාලය කළමනාකරණය කිරීමේ කුසලතා
ගෝලීය කළමනාකරණ කුසලතා

48. අ) පරිවාසකාලය
ආ) ආධුනික කාලය

49. ආදාන, ප්‍රතිදාන, සැකසීම, බෙදාකරණය.

50. ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය.
ඇස්තමේන්තු ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය
ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය
ණය ආපසු ගෙවීමේ සටහන.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ

සාධන පරීක්ෂණය 2025

ව්‍යාපාර අධ්‍යයනය IIපත්‍රය

ලකුණු දීමේ පටිපාටිය

1. i. (අ) - භාණ්ඩ- බිරියානි, චොක්ලට් බ්‍රවුනීස්

- සේවා- අලෙවිකරනය (ලකුණු 02 යි)

(ආ) පාරිභෝගිකයන්/ අයිතිකරු/ තරගකරුවන්/ රජය (ලකුණු 02 යි)

Ii (අ) 1. නිෂ්පාදන ස්වභාවය අනුව - ද්විතීක

2. හිමිකාරීත්වය අනුව - පෞද්ගලික (ලකුණු 02 යි)

(ආ) පාරිභෝගිකයෝ, සැපයුම්කරුවෝ, තරගකරුවෝ, ආදේශන භාණ්ඩ

නිෂ්පාදකයෝ, වෙළඳපළට පිවිසීමට අපේක්ෂිත නව ව්‍යාපාරිකයෝ (ලකුණු 02 යි)

iii. (අ) ඇණවුම් ලබා ගැනීමට නව තාක්ෂණය භාවිත කිරීම, තම පවුලෙන් උදව් ලැබීම(ලකුණු 02 යි)

(ආ) - ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය දිනා ගැනීමට

- නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට

- ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීමට

- ගනුදෙනුකරුවන් රඳවා ගැනීමට

- වෙළෙඳපොළ රැඳී සිටීමට (ලකුණු 02 යි)

iv. (අ) -අපද්‍රව්‍ය වර්ගීකරණය

- කාබනික අපද්‍රව්‍ය නිසි ලෙස යොදා ගැනීම

-නැවත භාවිතය

- ප්‍රතිචක්‍රීකරණය (ලකුණු 02 යි)

(ආ) -විකුණුම් හෝ හුවමාරු වීම් සිදුවීම

-භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදුවීම

- ගනුදෙනු අඛණ්ඩව සිදුවීම

-වුවමනා නිර්මාණය කිරීම

-ආර්ථික කටයුත්තක් වීම (ලකුණු 02 යි)

v. -අද්‍රව්‍ය වර්ගීකරණය හා නැවත භාවිතය හා ප්‍රතිචක්‍රීකරණය කිරීම

-පිරිසිදු හා ි පරිසර හිතකාමී නිෂ්පාදන ක්‍රියාවලි භාවිත කිරීම

-ආයතන පරිසරය පිරිසිදුව තබා ගැනීම

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

-සේවකයින් අතර පරිසර හිතකාමී පුරුදු වැඩි කිරීම

-විෂ රහිත ආහාර හා සෞඛ්‍ය සම්පන්න ජීවන රටා ප්‍රවර්ධනය කිරීම

-ව්‍යාපාරය අවට ප්‍රජාවගේ යහපැවැත්ම සඳහා දායක වීම (ලකුණු 04 යි)

2. i. (අ) - හවුල්කරුවන් අවම සංඛ්‍යාව දෙදෙනෙකු සිටිය යුතු අතර උපරිමය විස්සකට සීමා වීම

- හවුල්කරුවන් අතර ගිවිසුමක් පැවතිය යුතු වීම

- ලාභ බෙදා ගැනීම සඳහා වූ යම් එකඟතාවක් දැකිය හැකි වීම

- සෑම හවුල්කරුවෙකු ම තමාගේ හා සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයකු හා ප්‍රධානයකු වශයෙන් සැළකීම( අන්‍යෝන්‍ය නියෝජ්‍යත්වය) (ලකුණු 02 යි)

(ආ) - ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සඳහා සහභාගි වීමට ඇති අයිතිය

- යොදනු ලබන අමතර ප්‍රාග්ධනයට පොලී හිමිවීම

- ලාභයට දායකවීම

- ගිණුම් පොත් පරීක්ෂා කිරීමට පිටපත් කිරීමට ඇති අයිතිය (ලකුණු 02 යි)

ii. (අ) - සියලුම හවුල්කරුවන්ගේ කැමැත්ත නොමැතිව හවුල්කරුවකු බඳවා ගත නොහැක(ලකුණු 02 යි)

(ආ) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වගන්තිය (ලකුණු 02 යි)

iii. (අ) - තනිව තීරණ ගැනීමට හැකිවීම

- ලාභය ලාබයේ තනිව භුක්ති විඳීමට හැකිවීම

- ව්‍යාපාරික තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා වීම (ලකුණු 02 යි)

(ආ) - පාරිභෝගිකයින් සුහදව පිළිගැනීම

- පාරිභෝගිකයන්ට අවංක වීම

- පාරිභෝගිකයන්ට සත්‍ය තොරතුරු පැවසීම

- විනීතව ඉවසීමෙන් කටයුතු කිරීම (ලකුණු 02 යි)

iv. (අ) ස්වයං ඇගයී / පුහුණුව / අධ්‍යාපනය/ අත්දැකීම් වලින් ඵල ලැබීම (ලකුණු 02 යි)

(ආ) - ආර්ථික වර්ධනය

- රැකියා අවස්ථා බිහිවීම

- දේශීය නිෂ්පාදන වැඩිකිරීම

- නිර්මාණශීලීත්වය හා නවෝත්පාදනය

- අපනයන ඉහළ නැංවීම

- ජාතික ආදායම් වැඩි කිරීම

- ප්‍රාදේශීය සංවර්ධනය (ලකුණු 02 යි)

v. (අ) -තම හැකියා හා කුසලතා පිළිබඳව අධ්‍යනය කිරීම හා ඇගයීම

- නිෂ්පාදිතයට ඇති වෙළඳපළ හා එම වෙළඳපළට ළඟා විය හැකිද යන්න

-ආරම්භක ප්‍රාග්ධනය හා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය පිළිබඳ අධ්‍යයනය කිරීම

-ව්‍යාපාර විධාන ක්‍රමය පිළිබඳව අධ්‍යයනය

-ව්‍යාපාර ංවිධාන ක්‍රමය හා පවතින නීති රීති

-පවතින තරගකාරීත්ව (ලකුණු 02 යි)

(ආ) -ණය පහසුකම්

- නිසි ප්‍රතිපත්ති හා නීතිරීති

- පුහුණු වැඩසටහන්

- වෙළඳපොළ අවස්ථානය සැලසීම

-තාක්ෂණික සහයෝගය

- යටිතල පහසුකම් ලබා දීම (ලකුණු 02 යි)

3. I (අ) භෞතික මුදල් භාවිත නොකර, අන්තර්ජාලය හෝ විද්‍යුත් තාක්ෂණය මගින් සිදුකරන ගෙවීම් ක්‍රමයකි. (ලකුණු 02 යි)

(ආ) - credit card/ debit card

- mobile payment

- internet banking

- QR code payment (ලකුණු 02 යි)

ii. (අ) -භෞතිකව මුදල් අවශ්‍ය නොවීම

- ඉක්මන් හා පහසුවීම්

- විද්‍යුත් තාක්ෂණය මත පදනම් වීම

- ආරක්ෂාව සඳහා මුරපද වැනි, PIN, OPT,2FA ක්‍රම භාවිත කළ හැකිවීම

- පරිසර හිතකාමී බව (ලකුණු 02 යි)

(ආ) -OTP අංකය බාහිර පුද්ගලයන්ට දීමෙන් වැළකීම

- කාඩ් පත මත ඔබගේ අත්සන යෙදීම

-කාඩ් පත හා PIN අංකය එකම ස්ථානයක තබා නොගැනීම

-කාඩ්පත නැතිවූ වහාම අදාළ බැංකුව වෙත දැනුම් දීම

-විශ්වාසදායින් වෙබ් අඩවිවල පමණක් කාඩ් පත් භාවිත කිරීම

-කාඩ් පතේ තොරතුරු අන් අය සමඟ බෙදා නොගැනීම

-Sms සේවාව සක්‍රීය කර ගැනීම (ලකුණු 02 යි)

Iii. (අ) අනකරු විසින් ගෙවීම් නතර කර තිබීම

අණකරු බුන්වත් වීම

අණකරු මරණයට පත්වීම හා ඒ බව බැංකුවට දැනුම් දී තිබීම

ගානිෂ නියෝගයක් ලැබීම

ගිණුම වසා තිබීම (ලකුණු 02 යි)

(ආ) <u>ගනුදෙනුකරුට</u>

අවශ්‍ය අරමුදල් නියමිත කාලයට නොලැබීම

ව්‍යාපාර කටයුතු හා ගෙවීම් ක්‍රියාවලිය ප්‍රමාද වීම

විශ්වාසය අඩුවීම

බැංකු ගාස්තු හා නීතිමය ගැටලුවලට මුහුණ දීම

<u>ව්‍යාපාරිකයාට</u>

ගනුදෙනුකරුගේ විශ්වාසය පළුදු වීම

නීතිමය පියවර වලට මුහුණ දීමට සිදුවීම

ආර්ථික හා සමාජයේ ගෞරවයට හානි සිදුවීම (ලකුණු 02 යි)

iv. (අ) රක්ෂණ ඔප්පුව යනු කිසියම් ජීවිතයකට හෝ දේපලකට අදාළව ලක්ෂණ ගිවිසුමක් ඇතිවූ පසු ව ඊට අදාළව රක්ෂණ සමාගම විසින් රක්ෂිතයාට දෙනු ලබන ලිඛිත සහතිකයයි.

(ලකුණු 02 යි)

(ආ) තෙවන පක්ෂය යනු ගිවිසුම් ක්‍රියාකාරිත්වය තුළින් ඇතිවන බාහිර පක්ෂ පිළිබඳ සම්බන්ධතාවයි.

(ලකුණු 02 යි)

v. (අ) නාවික අපගමනය (ලකුණු 01 යි)

(ආ) - මූල්‍ය ආරක්ෂාව

- දරුවන්ගේ අධ්‍යාපනය අඛණ්ඩව කරගෙන යාමට හැකිවීම

- ණය ගෙවීමට හැකිවීම

- පවුලේ මානසික නිදහස ඇතිවීම

- නව ආයෝජනයකට යොමු වීමට හැකි වේ (ලකුණු 02 යි)

4.i. (අ) - ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි අඩුවේ.

-සේවක විශ්වාසය හා අභිප්‍රේමය ඉහළ යයි.

-ආදායම ඉහළ යයි (ලකුණු 02 යි)

(ආ) - සතිපතා හා මාසිකව රැස්වීම් කැඳවීම

-නිවැරදි උපදෙස් ලබාදීම

-ප්‍රතිචාර ලබා ගැනීමට නිසි ක්‍රමවේදයක් සැකසීම

- WhatsApp වැනි ක්ෂණික පණිවිඩ හුවමාරු කළ හැකි සමූහයක් සකස් කිරීම (ලකුණු 02 යි)

ii. (අ) - දුම්රිය ප්‍රමාදය

-පහසුකම් නොමැතිවීම

-නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව

-යල්පැන ගිය තාක්ෂණය

-අධික තදබදය (ලකුණු 02 යි)

(ආ) - දිනපතා විශාල සේවක පිරිසක් ප්‍රමාද වී තම සේවා ස්ථානයට පැමිණීම හේතුවෙන් සේවක අකාර්යක්ෂමතාව ඉහළ යයි

-අමු ද්‍රව්‍ය නිසි වෙලාවට ගෙන ඒමට නොහැකි වීමෙන් ව්‍යාපාරික ක්‍රියාකාරකම් අඩාල වේ

-රටේ සමස්ත ආදායම අඩුවේ

-විකල්ප ප්‍රවාහන මාධ්‍ය වලට මාරු වීම නිසා පිරිවැය ඉහළ ගොස් භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යයි

(ලකුණු 02 යි)

iii. (අ) - භාණ්ඩයේ ස්වභාවය

- භාණ්ඩ වර්ගය

-ආපසු ලබා ගැනීමට ඇති පහසුව (ලකුණු 02 යි)

(ආ) -ගබඩා කුලිය

- ඇප තැන්පතු

- රක්ෂණ ගාස්තු

- වාහන නවතා තැබීමේ ඉඩකඩ හා සම්බන්ධ වියදම් (ලකුණු 02 යි)

iv. (අ) - ලාභ ඉහළ යෑම

- පාරිභෝගිකයා හා ඍජුව සම්බන්ධ විය හැකිවීම

- වෙළඳ නාමය පාලනය කළ හැකිවීම

- වෙළඳපොළ වෙනස්කම්වලට වේගයෙන් ප්‍රතිචාර දැක්විය හැකිවීම (ලකුණු 02 යි)

(ආ) - ප්‍රධානියා වෙනුවෙන් ණයට භාණ්ඩ විකිණීම සිදුකර එම ණය මුදල් අදාළ පාර්ශවයන්ගෙන් එකතු කර දීමට කැපවෙමින් කටයුතු කරන නියෝජිතයා කැපකරු නියෝජිතයා වේ. ඔහුට සාමාන්‍ය කොමිස් මුදලට අමතරව කැපකරු කොමිස් මුදලක් ද හිමි වේ (ලකුණු 02 යි)

v. (අ) ආනයනකරුගේ ඉල්ලීම මත ආනයනකරු වෙනුවෙන් ඔහුගේ බැංකුව විසින් අපනයනකරුගේ

බැංකුව වෙත ණයවර ලිපිය නිකුත් කෙරේ. අපනයනකරු විසින් ආනයනකරුවකු වෙත අපනයන කරනු ලබන භාණ්ඩවලට මුදල් ගෙවීම තහවුරු කිරීම සඳහා ආනයනකරුගේ බැංකුව නිකුත් කරන ලියවිල්ලකි. (ලකුණු 02 යි)

(ආ) -ගෙවීම් සහතිකයක් වීම

-ගනුදෙනුකරුවන් අතර විශ්වාසය වැඩි කිරීම

-ගෙවීම් නොකිරීමේ හෝ වංචා සිදුකිරීමේ අවධානම අඩුවීම

-විදේශ වෙළඳාමට පහසු වීම (ලකුණු 02 යි)

5. i. (අ) -සබඳතා පවත්වන්නා- විවිධ පාර්ශ්ව සමඟින් මනා සම්බන්ධතා පවත්වා ගැනීම

- ව්‍යවසායකයා- නව නිෂ්පාදනය කෙරෙහි අත්හදා බැලීම් කිරීම (ලකුණු 02 යි)

(ආ) -ආයතනයේ පරමාර්ථ හා අරමුණු සාර්ථකව ළඟා කර ගැනීමට

- සීමිත සම්පත් කාර්යක්ෂමව හා සඵලදායිව යොදාගැනීමට
- ගතික ව්‍යාපාර පරිසරයට සාර්ථක ප්‍රතිචාර දැක්වීමට
- ගැටලු වලට සාර්ථකව මුහුණ දීමට හා නිවැරදි තීරණ ගැනීමට (ලකුණු 02 යි)

ii. (අ) - ප්‍රමාණවත් හා නිවැරදි තොරතුරු යොදා නොගැනීම

- පසුගිය උපනිතීන් හා පවත්නා දත්ත මතු සැලසුම් සකස් කිරීම
- හැකියාව හා ධාරිතාව ඉක්මවා සැලසුම් සකස් කිරීම
- සැලලසුම්කරනයේ ප්‍රයෝජනය පිළිබඳ දැනුම මඳකම
- ආයතනයේ සෑම මට්ටමකම සේවකයින් සම්බන්ධ කර නොගැනීම (ලකුණු 02 යි)

(ආ) - ප්‍රියජනක බව

- උසස් පෞරුෂත්ව ලක්ෂණ
- බුද්ධිමත් බව
- ආත්ම විශ්වාසය
- කායික හා මානසික නිරෝගී බව
- ස්වයං විනය
- අධිෂ්ඨානය
- කැපවීම (ලකුණු 02 යි)

iii. (ආ) සහගාමී/ ක්‍රියාවලි පාලනය (ලකුණු 02 යි)

(ආ) - නිෂ්පාදන ක්‍රියාවලියේ දී සිදුවන තත්ත්ව පාලනය

- අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය
- තොග පාලනය (ලකුණු 02 යි)

iv. (අ) එක් වරකට එක සමාන භාණ්ඩ සමූහයක් නිෂ්පාදනය කරයි. අඛණ්ඩ ක්‍රියාවලියකින් නිෂ්පාදනය කරනු ලබන අතර බොහෝ දුරට ස්වභාවය අනිත් එක සමාන වුවද කාණ්ඩයන් කාණ්ඩයට යොදාගන්නා අමුද්‍රව්‍ය, ශ්‍රමය, ප්‍රමාණ, වර්ග හා පැය ගණන වෙනස් විය හැක.

(ලකුණු 02 යි)

(ආ) <u>වාසි</u>

- කාණ්ඩයෙන් කාණ්ඩයට නිෂ්පාදිතය නිමාව වෙනස් කළ හැකිවීම
- සාපේක්ෂව විශාල තොග වශයෙන් නිෂ්පාදනය කළ හැකිවීම නිසා පිරිවැටුම ඉහළ යාම

- ඇණවුම් නිෂ්පාදනයට සාපේක්ෂව ඒකක පිරිවැය අඩුවීම

අවාසි

- කාණ්ඩයෙන් කාණ්ඩයට යන්ත්‍ර හා උපකරණ නැවත සැකසීමට සිදුවීම නිසා පිරිවැය වැඩිවීම

- ප්‍රවාහ නිෂ්පාදනයට සාපේක්ෂව ඒකක පිරිවැය වැඩිවීම

- ප්‍රවාහය නිෂ්පාදනයට සාපේක්ෂව මහා පරිමාණ පිරිවැසුම් අඩුවීම (ලකුණු 02 යි)

v. (අ) - ස්වයංක්‍රීය උපකරණ භාවිතය

-vacuum sealing වැනි උපකරණය ඇසුරුම්කරණය සඳහා යොදා ගැනීම

- ඩිජිටල් වෙළඳාම

- ගබඩා කිරීමේදී cold storage system වැනි දෑ භාවිතා කිරීම (ලකුණු 02 යි)

(ආ) - නාස්තිය අවම වීම

-නව නිෂ්පාදිත වෙළඳපොළට හඳුන්වා දීමට හැකිවීම

-නිෂ්පාදිතවල ගුණත්වය ඉහළ යාම කාර්යක්ෂමතාව ඉහළ යාම

-සේවකයන් අඩු ප්‍රමාණයක් යොදා ගැනීමට හැකිවීම -හිතකර වැඩ පරිසරයක් නිර්මාණය වීම

-නිෂ්පාදන ධාරිතාව වැඩි වීම

- මහා පරමාණ නිෂ්පාදන පිරිමැසුම් ලබා ගත හැකි වීම (ලකුණු 02 යි)

6. I, (අ) සාකල්‍යවාදීම අලෙවි කරන සංකල්පය (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයේ සියලුම ඇල්මැති පාර්ශ්වයන් දීර්ඝකාලීනව දෙපාර්ශවයටම ප්‍රතිඵලදායී

සම්බන්ධතා ගොඩනැගීම සම්බන්ධතා අලෙවිකරණය ඉලක්කයයි. එහි ප්‍රතිඵලය වන්නේ ව්‍යාපාරයක් එහි සියලු මැල්මැති පාර්ශවයන් අතර ලාභදායී සම්බන්ධතා සහිත අලෙවිකරණ ජාලයක් නිර්මාණය වීමයි. ( ලකුණු 02 යි)

ii. (අ) නිෂ්පාදනය ආරක්ෂාව

පරිසර සුරක්ෂිත බව

පාරිභෝගික ආරක්ෂණය

තොරතුරු දැනුවත් කිරීමේ හැකියාව

අලෙවිකරන මෙවලමක් ලෙස ( ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදනය සම්බන්ධ තොරතුරු

භාණ්ඩයේ නම හෝ සන්නම

මිල

අඩංගු ද්‍රව්‍ය

නිෂ්පාදිත දිනය

කල් ඉකුත් වීමේ දිනය

ගබඩා කිරීමේ හා ප්‍රවාහනයට හා භාවිතයට උපදෙස්

ප්‍රමිති ලාංඡන ( ලකුණු 02 යි)

iii. (අ) වෙළඳපොළ තුළ රැඳී සිටීම

වර්තමාන ලාභ උපරිම කිරීම

වෙළඳපොළ කොටස උපරිම් කිරීම

වෙළඳපොළ සාරය උරා ගැනීම

නිෂ්පාදිත ගුණත්ව නායකත්වය ( ලකුණු 02 යි)

(ආ) සමාජ මාධ්‍ය

අන්තර්ජාලය

සඟරා

පුවත්පත්

පෝස්ටර්ස් ( ලකුණු 02 යි)

iv. (අ) බැංකු ණය

කල්බදු

බැංකු අයිරා

උකස් කර

කුලීපිට ගැනුම් ( ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරය සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම

විකල්ප ආයෝජන අවස්ථා හඳුනාගත හැකි වීම

වැඩි ප්‍රතිලාභ සහිත ආයෝජන තෝරා ගැනීම ( ලකුණු 02 යි)

v. (අ) කෙටිකාලීන මූල්‍ය බැඳීම්වලට මුහුණ දීමට ඇති හැකියාව පෙන්නුම් කරන අනුපාත ද්‍රවශීලතා අනුපාත වේ.

<u>අරමුණු</u>

කෙටිකාලීන නුබුන්වත් බව බැලීමට

අධික ණය ගැනීම නිසා ඇතිවන ගැටලු මගහරවා ගැනීමට

අරමුදල් කළමනාකරණය කිරීමට ( ලකුණු 02 යි)

(ආ) - රජයේ ආරක්ෂාව ලැබීම

- ඉහළ ද්‍රවශීලතාවයක් පැවතීම

- අයෝජන අවස්ථාවේදීම ප්‍රතිලාභ හිමි වීම

- ඉහළ හා ස්ථාවර පොළියක් හිමි වීම

- ආයෝජනයේ අවදානම ඉතා අඩු මට්ටමක පැවතීම

- බදු සහන හිමිවීම ( ලකුණු 02 යි)

7. i. (අ) - මූලික නිකුතුවක් මගින්

- විකුණුම් අර්පනයක් මගින්

- හඳුන්වා දීමක් මගින් (ලකුණු 02 යි)

(ආ) - පුද්ගලයන් හා ආයතන ආයෝජන සඳහා දිරි ගැන්වීම

- ආයෝජකයන්ට, කොළඹ කොටස් හුවමාරුව හරහා විවිධ ප්‍රතිලාභ ලබා ගත හැකිවීම

- සමාගම්වලට විශාල ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකිවීම

- සමාගම්වල කොටස් සඳහා ද්විතීයක වෙළඳපළක් ඇතිවීම

- විදේශ ආයෝජකයන් රටට අද්දවා ගත හැකිවීම

- රජයේ සුරකුම්පත් අලෙවි කිරීමෙන් රජයට අවශ්‍ය අරමුදල් ලබාගත හැකිවීම

- සමාගම් වලින් කොටස් වලට වටිනාකමක් නිර්මාණය වීම

- සමාගම්වල කීර්තිනාමය හා ප්‍රතිරූපය ඉහළ යාම (ලකුණු 02 යි)

ii. (අ) - නිෂ්පාදනය සඳහා ඉල්ලුම ඉහළ යාම (අපනයන30% වැඩි කිරීම)

- ගණකාධිකාරිනිය වන මාලනී මහත්මිය විදෙස් ගතවීම ( ලකුණු 02 යි)

(ආ) වාසි

- නව දැනුම ඇති පුද්ගලයන් ආකර්ෂණය කරගත හැකිවීම

- විශාල පිරිසක් ආකර්ෂණය කරගත හැකි වීම

- තනතුරු සඳහා යෝග්‍යතම පුද්ගලයන් බඳවා ගත හැකි වීම

- පුහුණු ශ්‍රමය පදවා ගැනීමෙන් පුහුණුව හා සංවර්ධනය සඳහා වන පිරිවැය අඩුවීම

- ව්‍යාපාර සංවිධානය නවීකරණය වීම හෙවත් නැවත ගොඩනැංවීමට හැකිවීම

අවාසි

- ආයතනයේ සිටින සේවකයන්ගේ හිප්‍රේරණයට බාධා ඇති විය හැකියි

- ආකර්ෂණය සඳහා වන පිරිවැය ඉහළ යාම -ආකර්ෂණය සඳහා ගතවන කාලය අධික වීම

-සේව්‍ය-සේවක සබඳතාවලට අහිතකර ලෙස බලපෑ හැකිවීම ( ලකුණු 02 යි)

iii. (අ) ස්ථිර පදනම/ තාවකාලික පදනම ( ලකුණු 02 යි)

(ආ) - රැකියාව සම්බන්ධයෙන් නිල ලියවිල්ලක් වීම

- සේවක කොන්දේසි (වැටුප්, දීමනා, නිවාඩු, කාර්යන්) පැහැදිලිව දැනගැනීමට හැකිවීම

- නීත්‍යානුකූල ආරක්ෂාවක් ලබාදීම

- සේවකයාගේ අයිතිවාසිකම් හා වගකීම් පැහැදිලි කිරීම

- ගැටලු මතුවූ විට සාක්ෂියක් ලෙස භාවිතා කළ හැකිවීම ( ලකුණු 02 යි)

iv. (අ) - දුක්ගැනවිල්ලට මැනවින් සවන් දීම

- දුක්ගැනවිල්ලට හා ඒ ඉදිරිපත් කරන සේවකයාට අදාළව නිවැරදි තොරතුරු රැස් කිරීම

- සේවකයා පවසන කරුණුවලට හොඳින් ඇහුම්කන් දීම

- සේවකයා පවසන කරුණු නිවැරදි නම් ඒවා පිළිගැනීම

- සේවකයා තුළ විශ්වාසය ගොඩනැංවීම ( ලකුණු 02 යි)

(ආ) - ශ්‍රම පිරිවැටුම වැඩිවීම

- සේවකයන් නිවාඩු ගැනීම් ඉහළ යෑම

- ශ්‍රම ඵලදායිතාව අඩුවීම

- නිෂ්පාදනය ගුණාත්වය පහළ යාම

- ඵලදායිතාව අඩුවීම

- නිතර නිතර පුරප්පාඩු පිරවීමට සිදුවන බැවින් පිරිවැය වැඩිවීම

- කාර්මික සාමය බිඳවැටීම ( ලකුණු 02 යි)

v. (අ) - සෙමින් වැඩ කිරීම

- කළු පටි පැළඳ වැඩ කිරීම

- අතිකාල වැඩවල නොයෙදීම

- වැඩවල නොයෙදීම

- වැඩ මගහැරීම

- කඩාකප්පල් කිරීම

- උපවාස

- සංවිධානාත්මක ලෙස නිවාඩු ගැනීම

- සංකේත වැඩ වර්ජන

- අඛණ්ඩ වැඩ වර්ජනය (ලකුණු 02 යි)

(ආ) - සමාජ ප්‍රශ්න වර්ධනය වීම

- ජන ජීවිතය අඩාල වීමට හේතු වීම

- වෙළඳ පොළෙහි භාණ්ඩ හිඟවීම

- භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම

- භාණ්ඩවල ගුණාත්වය පහළයාම (ලකුණු 02 යි)

8. i. (අ) - රූපමය දත්ත- භාණ්ඩවල ඡායාරූප

- සංඛ්‍යාමය දත්ත - භාණ්ඩවල මිල ගණන්

- ශ්‍රව්‍යමය දත්ත - පටිගත කරන ලද පාරිභෝගික අදහස්

- දෘශ්‍යමය දත්ත - මිල ගනන් දැක්වෙන නාමපුවරු (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරික තීරණ ගැනීම හා පාලනය සඳහා අවශ්‍ය වන තොරතුරු රැස්කිරීම සැකසීම ගබඩා කිරීම හා බෙදා හැරීම සඳහා අන්තර් සම්බන්ධතාවයකින් යුත් උපාංග සමූහයක එකතුවක් තොරතුරු පද්ධතියක් ලෙස හැඳින්වේ. (ලකුණු 02 යි)

ii. (අ) සංවිධානයකින් දෛනික මෙහෙයුම් කටයුතුවලින් බිහිවන දත්ත, සැකසීමට භාජනය කරන තොරතුරු පද්ධති ගනුදෙනු සැකසුම් පද්ධති වේ.

- නිෂ්පාදන අංශය - ද්‍රව්‍ය මිලට ගැනීමට, ද්‍රව්‍ය ඇණවුම් කිරීමට

අලෙවි කරන අංශය - විකුණුම් ඇණවුම් ලබා ගැනීමට, මිළ කිරීමට

මූල්‍ය අංශය/ ගිණුම් වංශය- අය වැය ලේඛන සැකසීමට, පොදු ලෙජරය පිළියෙළ කිරීමට

මානව සම්පත් අංශය - වැටුප් වාර්තා සකස් කිරීමට, සේවක පැමිණීම වාර්තා කිරීමට, පුහුණුව හා සංවර්ධනයට (ලකුණු 02 යි)

(ආ) මෙය විධායක උපකාරක පද්ධතිය ශක්තිමත් කරන පද්ධතියකි. මෙම පද්ධතිය නිර්මාණය කරනුයේ තීරණ උපකාරක පද්ධති සඳහා භාවිතා කරන දත්ත හා තොරතුරු භාවිතා කරමිනි. මෙය හැකියා, ක්‍රියාවලින්, තාක්ෂණය භාවිතයන් හා පරිචයන්ගෙන් සමන්විත වූ පද්ධතියකි.

(ලකුණු 02 යි)

iii. (අ) - වඩා නිවැරදි තීරණ ගැනීමට හැකිවීම හා තීරණ ගැනීමට පහසුවීම

- ක්‍රියාවලි කාර්යක්ෂම වූ සිදු කරගත හැකිවීම

- කටයුතුවල වැරදි අවම වීම හා විශ්වාසනීයත්වය වැඩිවීම

- නිමැවුම්වල ගුණාත්මක භාවය ඉහළ යාම

- තොරතුරු සඳහා ඉතා විශාල ගබඩා ධාරිතාවක් තිබීම

- තරගකාරීත්වයට මුහුණ දීමට හැකිවීම (ලකුණු 02 යි)

(ආ) - වේගවත් බව

- නිවැරදිතාව

- නම්‍යශීලී බව

- විශ්වාසවන්ත භාවය

- ගුණාත්මක භාවය වර්ධනය

- තප්‍රමාණයක් කළමනාකරණය කිරීම

- අඩු සේවක සංඛ්‍යාවක් ප්‍රමාණවත් වීම

- ඩු ඉඩකඩ ප්‍රමාණවත් වීම

- පිරිවැය අඩුවීම (ලකුණු 02 යි)

iv. (අ) - නිෂ්පාදිත සඳහා ්රමාණවත් හා වර්ධනය වන වෙළඳපළක් ඇති බව පෙන්වාදීමට

- වෙළඳපොළේ තරගකාරීත්වයට මුහුණ දිය හැකි බව පෙන්වාදීමට (ලකුණු 02 යි)

( ආ) - පවත්නා තරගකාරීත්වය

- තරගකරුවෝ හා ඔවුන්ගේ ශක්ති

- තරගකාරීත්වයට මුහුණ දීමට තමා සතු ශක්තීන් හා දුර්වලතා

- වෙළඳපළට පිවිසීමට ඇති බාධා (ලකුණු 02 යි)

v. (අ) විධායක සාරාංශික මූලික පරමාර්ථයබාහිර පාර්ශව තවදුරටත් ව්‍යාපාරය පිළිබඳව සොයා බැලීමට පෙලඹවීම වේ. ( ලකුණු 02 යි)

(ආ) - විධායක සාරාංශය සමස්ත ව්‍යාපාර සැලැස්ම පිළිබඳව පෙර දැක්මක් ඇති කිරීම

- සැලැස්ම පිළිබඳව මග පෙන්වීමක් ලබාදීම

- ව්‍යාපාර සැලැස්ම පිළිබඳව විශ්වාසයක් ඇති කිරීම ( ලකුණු 02 යි)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources